
# ළමා ප්‍රදීපය

ආසියාවේ පළවන
එකම කතෝලික
ළමා පුවත් පත

ක්‍රි. ව. 2015 මැයි 25 සඳුදා
07 වෙළුම - 26 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 21/ News/ 2015



## කඩොල් උයන, සාන්ත ජෝසප් ශාඛා විදුහලේ පළමු විදුහල්පති හා නිර්මාතෘ ගරු සුදත් ගුණතිලක පියතුමන්

### හිරු සේ ඔබ අපට දැනෙනවා පියාණනී....

හිරු පායනා සඳු බබළනා මහා අහස් ගැබ නුඹයි
ගල් වැටි පීරා හැපෙමින් ගලනා දිය කඳ නුඹයි
සියොතුන් සරනා මහා පොළොව අගයනා නුග රුක නුඹයි
සුදතුම් පහසින් ගුණ සුවඳ පතුරනා තිලකය නුඹයි

- ළමා ප්‍රදීපයේ ජෝසපියානු දරු කැළ -

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# ළමා ප්‍රදීපයට කවදත් ආදර සුදත් ස්වාමි

**ආදරණීය දුවේ පුතේ...**

ළමා ප්‍රදීපය ආරම්භයේ සිටම ඒ පුවත් පත හා සමග අත්වැල් බැඳගෙන එහි දියුණුවට සෑම අතින්ම උදව් උපකාර කළ පියතුමෙක් සම්බන්ධව අද ළමා ප්‍රදීපය එක්තරා මාදිලියක අතිරේකයක් ගෙන එනවා. මෙයට නිමිත්ත වුයේ මේ පියතුමාගේ ස්ථාන මාරුවයි. නමුත් ළමා ප්‍රදීපයට දක්වන අගනා සහයෝගයට ප්‍රති උපකාරයක් සේ සලකා එතුමන්ගේ සේවය අගයාලීමට ඉඩ ප්‍රස්ථාවක් ළමා ප්‍රදීපය කළක සිට සොයමින් සිටියේ. දැන් අවස්ථාවක් එළඹිලා තිබෙනවා අපේ කතා නායක මේ පියතුමන්ගේ ස්ථාන මාරුවත් සමගම. ඒ නිසා ළමා ප්‍රදීපයේ අපි කල්පනා කලා පියතුමාට ලබා දිය හැකි හොඳ ඇගයිමකට මෙය කදිම අවස්ථාවක් කියලා.

ආදර දුවේ, පුතේ, මේ පියතුමා තමයි ගරු සුදත් ගුණතිලක පියතුමා. මෙතුමා මීගමුව කඩොල් උයන සා. ජෝශප් විද්‍යාලයේ විදුහල්පති පියතුමායි, මෙතුමා තමයි ප්‍රථම විදුහල්පති පියතුමා, මේ මීගමුව කඩොල් උයනෙ සා. ජෝශප් විද්‍යාලයේ. මේ විදුහල ගොඩ නගා ඇති භූමි භාගය කලකට ඉහත වගුරු බිමක්. නමුත් එකී භූමිය මනාව සකස් කරලා පියවරෙන් පියවර මේ විදුහල ගොඩ නංවලා අද තිබෙන මේ විරාජමාන තත්ත්වයට උසස් කරන්න ගරු සුදත් ගුණතිලක පියතුමා අප්‍රතිහත ධෛර්යක් දුන්නා, කැපවුනා, වැයවුනා. පියතුමාගේ ආදර්ශය හා අවවාදය වුනේ මේ බිමේ හැදි වැඩෙන අකුරු කියවන දරුවන්ව කතෝලික අධ්‍යාත්මයෙන් මනාව ශක්තිමත් කර සාර්ථක අධයාපනයක් ලබාගන්නට සුදනම් කළ යුතු බවයි. ඒ නිසාම මෙම විදුහල සර්ව සම්පූර්ණ කරමින් කතෝලික අධ්‍යාත්මයේ හඬ ශබ්දයට දරුවන්ව පුරුදු පුහුණු කරන්නට ගරු සුදත් ගුණතිලක පියතුමා මුලික වශයෙන්ම අඩිතාලම යොදන්නට වෙහෙස මහන්සි වී වැඩ කලා.

ආදර දුවේ, පුතේ, මම ඉහතින් සඳහන් කළ ආකාරයටම කුඩා අවදියේ පටන්ම පාසලේ දූ දරුවන්ට විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ දහම් පන්නරය ලබා දෙන්නට අපේ පියතුමා විවිධ පැතිකඩ අනාවරණය කළා. ළමා ප්‍රදීපය පුවත් පත මේ පාසලේ ඉගෙනුම ලබන දූ දරුවන්ට ලබා දීමට ගරු සුදත් ගුණතිලක පියතුමා අචාර්ය මණ්ඩලයේ ගරු පියවරුන් හා ගුරු මෑණිවරුන් සමග විශාල වැඩ කොට සක් ඉටු කළා. දැනටත් ඉටු කරනවා. ළමා ප්‍රදීපය පුවත් පත පාසලේ කුඩාම පංතියේ සිට දූ දරුවන්ට හඳුන්වා දෙමින් එදා පත්තර 50 කින් පටන් ගත් ක්‍රියා දමය අද වන විට පත්තර 1000 ඉක්මවා ගොස් තිබෙනවා. මීගමුව කඩොල් උයනෙ සා. ජෝශප් විද්‍යාලයේ ඉගෙනුම ලබන සෑම දූ දරුවෙක් අතේම අද ළමා ප්‍රදීපය පුවත් පත රැඳී තිබෙනවා. අද මුළු පාසලේම දූ දරුවන් ළමා ප්‍රදීපයේ පාඨකයෝ. ඒ පමණක් නොවේ. ළමා ප්‍රදීපයේ ලේඛක ලේඛිකාවෝ මේ අයුරින් සියල්ලටම පසුබිම් සකස් කළේ ගරු සුදත් ගුණතිලක පියතුමායි. එතුමාට ආචාර්ය මණ්ඩලයේ ගුරු භවතුන් මනා ආධාරයක් වුනා. දරුවන් අත රැඳී ළමා ප්‍රදීපය රුචියෙන් ඔවුන් කියවලා බෙදා ගත් ඒ හැඳියා ජීවිතය ගැන අද ආචාර්ය මණ්ඩලය ගුරු පියවරු හා ගුරු මෑණිවරු ඉතාම සතුටෙන් කථා කරන්නේ.

ඉතින් ගරු සුදත් ගුණතිලක පියතුමාට වසර ගනනාවකට පස්සේ දැන් ස්ථාන මාරුවක් ලැබිලා. මීගමුව කඩොල් උයනේ සා. ජෝශප් විද්‍යාලයේ විදුහල්පති පියතුමන් ලෙස කටයුතු කරලා නොබෝ දිනකින්ම ගරු සුදත් ගුණතිලක පියතුමා මීගමුව දළුවා කොටුව ලොයලා විද්‍යාලයේ විදුහල්පති තනතුර භාර ගන්නවා. ළමා ප්‍රදීපයට ආදරය කරන හොඳ යහපත් දූ දරුවන් පිරිසක් සා. ජෝශප් විද්‍යාලයෙන් බිහි කිරීම ගැන ඇත්තෙන්ම අද සෑම කෙනෙක්ම ගරු සුදත් ගුණතිලක පියතුමන්ට ආශිර්වාද කරන්නේ හද පත්ලෙන් මයි. ඒ තරමම සුවිශේෂයි එතුමන්ගේ සේවා කාලය.

ආදර දුවේ,පුතේ. ඉතින් ගරු සුදත් ගුණතිලක පියතුමා ළමා ප්‍රදීපය මුල් කරගෙන ළමා ප්‍රදීපයේ හොඳ පාඨක පිරිසක් සා. ජෝශප් විද්‍යාලයෙන් බිහි කලාට ළමා ප්‍රදීපයේ අපි සියලුම දෙන ගරු සුදත් ගුණතිලක පියතුමන්ට හද පත්ලෙන්ම ස්තූතිය පිරි නමනවා. ළමා ප්‍රදීපය පුවත්පතට ආදරය කරන පියතුමන්ලා අතරින් ප්‍රමුඛස්ථානයක් ගන්නා ගරු සුදත් ගුණතිලක පියතුමනි, ළමා ප්‍රදීපයේ ලේඛක, පාඨක , පොඩි හිටියන් සැමගේ ආදරණීය ප්‍රාර්ථනා නව ධුරය භාරගන්නා මොහොතේ මෙලෙස ඉත සිතින්ම පතන්නෙමු.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# "සමිඳුන් අත් දකින්න පුංචි ඔබට ඔවදනක් මෙන්න"



ජේසුව ළමා ඔබත් අත් දකින්නට ආශා ඇති නේද? මේ මම කියන්න හදන දේ ක්‍රියාවෙන් කර බලන්න. එය සියයට සියයක් සාර්ථකයි. ජේසු විතරක් නොවේ ශුද්ධවූ අම්මා, සාන්තුවරයන්. ඒ වගේම මෝක්ෂයේ හැඩතල මේවා දකින්න පුළුවන් කියලා මම කියනකොට සමහරුන්ට පුදුම හිතේවි, පුදුම වෙන්න දෙයක් නෑ දරුවනි! මේ මගේ ජීවිතයේ අත්දැකීම්. මේවා මනසට ආශාවෙන් රිංගාගත් අදහස්. මමවත් සිතුවේ නැහැ. මම මේවා අත්දකිවි කියා. එනමුත් මගේ තිබූ ආශාව, භක්තිය සහ ආදරය ඒ අත්දැකීම් කිසිවකුගේ ආධාරයක් නොමැතිව දැක ගන්න මට වරම් ලැබුනේ මෙලෙසයි.

මම යාච්ඤා කරන විට භක්තියක් නොමැතිව ඔහේ ගිරවෙක් වගේ ළමා අවධියේ කියාගෙන කියාගෙන ගියා. කිසි බරපතලකමක් නැතිවම. හේතුව මගේ පියා අපට ආදර්ශයක් දුන්නා, සවස හය වෙනකොට දණගහලා යාච්ඤා කරන්න. මගේ අයියා පැට්‍රික් යාච්ඤාව ආරම්භ කළා. ජපමාල පන්ති සහෝදර, සහෝදරියෝ එක පන්තිය බැගින් බෙදා ගත්තා. අයියා එක පන්තියක් කියවලා ඉවර වෙද්දි ලොකු අක්කා රෙජින මරියා එකක්. ඊළඟ පොඩි අක්කා සැම්මා එකක්. ඊළඟට මම, අවසාන ජපමාල පන්තිය මල්ලි ජෙරාල්ඩ්. තාත්තා තමයි ප්‍රාර්ථනාව කියන්නේ. එක එක දිනවලට ප්‍රාර්ථනා වෙනස් වුණා. ජේසුට, ශුද්ධවූ අම්මාට, සුරැකි පියාට, සාන්තුවරයිනට මේ මගේ ඒ දිනවලට මංගල්‍යය වලට බෙදාගෙනයි තිබුණේ.

ඉතින් මෙහෙම කාලය ගතවුණා. මම විවාහ වෙලා රැකී රක්ෂාවලට යොමු වෙලා. දරුවෝ විහාහ වෙලා මුණුබුරන්ලා ලැබිලා සීයා කෙනෙක් වුණා. දෙවියන් කෙරෙහි ඇති භක්තිය මම අඩු තක්සේරුවන් බැලුවේ නැහැ. ඒ කාරණාව මට බොහෝ දුරට ඉවහල් වුණා මේ අත්දැකීම ලබාගන්න. මම ළමා අවධියේ යාච්ඤා කළේ ඇස් ඇරගෙන. පසු කාලීනව මම දෙනෙත් වසා යාච්ඤා කිරීමට පටන් ගත්තා. ඒ කාල පාරාසය හරිම සුන්දරයි. දැන් මේ මැයි මාසේ මැයි නුවාන පටන්ගත් කාලය නිසා යාච්ඤා කිරීම පටන් ගැන්මේ සිට අවසානය දක්වා දෙනෙත් වසා යාච්ඤා කරන්න, භක්තිය, ආදරය, විශ්වාසය, එකිනෙකාට ආදරය කරන්න. සතුරු අයට සිතින්, වචනයෙන්, ක්‍රියාවෙන්, අතපසුවීමෙන් හෝ වැරදි නොකරන්න, සිතින් ආදරය කරන්න. "ස්වාමිනී, ඔවුන් නොදැන කරන වැරදි වලට සමාව දෙන්න" කියලා කියන්න. මේ සියල්ල එක ගොන්නකට ගෙන යාච්ඤා කරද්දී, වටපිට නොබලන්න. ශබ්දවලට ඇහුම්කන් දෙන්නම එපා. අවධානයෙන් සිටින්න. යාච්ඤාවකට එකතුවන්න. දෙනෙත් පියාගන්න. ඔබට යාච්ඤාවට අනුව සිත යාච්ඤාවේ අර්ථය දැකගන්න පුළුවන් වේවි. ජේසුව සිතෙහි මවාගන්න. එතුමාණෝ ඔබ අසලට විත් හිස පිරි මදිවි, සිප ගනිවි, වැළඳ ගනිවි. ජේසු අම්මා, සාන්තුවරයන් මේ උත්තමයන් ගැන සිතන්න. ලස්සන ඇඳුමින් සැරසී වැඩම කොට ඔබට ඉහත සඳහන් දේවල් වලින් සරසාවි. නුවාන, යාච්ඤා, ධ්‍යාන, දිව්‍ය පූජාවලදී මේ කියු කරුණු සිතට ගෙන පිළිපැද අත්දැකීම් ලබාගන්න.

ඔබේ අත්දැකීම් අන් අය සමඟ බෙදාගන්න. යාච්ඤාව අවසානයේ පුදුමාකාර වින්දයක්, සතුටක් සහ සැනසිල්ලක් සිතට දැනේවි. ඔබේ ඉල්ලීම් වෙනුවෙන් යාච්ඤා කිරීමේදී රෝගාතුරවූ අයෙක් ඇත්නම් ඒ රෝගියාගේ නම උච්චාරණය කොට සුවය සඳහා යාච්ඤා කරන්න. ඔබේ ඉල්ලීම් ඉල්ලිය යුත්තේ "ස්වාමිනී, ඔබවහන්සේ මාගේ ප්‍රශ්න, ගැටළු දන්නා සේක. මට පිහිට වුව මැනව. සහනය ළඟා කරදුන මැනවි" කියන්න. එපමණයි. ඔබ කළහැකි දේ ඉතාමත් සරලයි. අත්දැකීම් ඔබට බහුලව ලැබේවි. "විශ්වාසය ඇතිව ඇදහිල්ලේන් ජීවත් වන්න සිතටගන්න"

ජුඩ් ජේ. ප්‍රනාන්දු මාමා -ගෙලිඔයය




මීගමුව, මහවීදිය සා. මරියා දේවස්ථානයේ තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය මගින් දෙවස්ථාන භූමියේදී මීසම් සේවක ගරු ක්ලෙමන්ට් රොසයිරෝ පියතුමාගේ ප්‍රධානත්වයෙන් අවුරුදු උත්සවයක් සංවිධානය කෙරෙනි. මෙහිදි ළමා අවුරුදු කුමරා හා කුමරිය තරඟයෙන් ජයලැබු පිරිස සේයාරුවෙහි දිස්වේ. **රේමන් අපෝන්සු**

## පුංචි අපේ කියුම් කෙරුම්



නාත්තන්ඩිය ලූර්දු මාතා තරුණ සමිතිය මඟින් පසුගියදා මීසම් සහයක ගරු සුජාන් නිශ්ශංක පියතුමන්ගේ මගපෙන්වීම යටතේ අවුරුදු උත්සවයක් සංවිධානය කෙරෙනි. ගරු සුජාන් නිශ්ශංක පියතුමන් හා ගරු ඉමෙල්ඩා පැවිදි සොයුරිය සමඟ සිඟිති අවුරුදු කුමරා තරගයේ ජයග්‍රාහකයින් මෙසේ ළමා ප්‍රදීපය සඳහා සේයාරුවකට පෙනි සිටි අයුරු.

**ශ්‍රියාංගණී ෆිලිෂියා**





කළුතර, නාගොඩ ශු. මිඛායෙල් අග්‍රදූත දහම් පාසලේ ශිෂ්‍ය නායක නායිකාවන්ට පදක්කම් පැළඳවීම පසු ගියදු එම දෙව්මැදුරේදී ගරු සමීර ෆොන්සේකා (නි.ම.නි) පියතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරෙනි. මීසම් සේවක ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමා, ශිෂ්‍ය නායක භාර ගුරුභවතුන් සමඟ සිසු නායක නායිකාවන් ළමා ප්‍රදීපය සඳහා සමුහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

**සුනෙත් ප්‍රනාන්දු**

# සඟ සැපත් ගාල්ල පදවියේ විශ්‍රාමික රදගුරු අති උතුම් එල්මෝ පෙරේරා හිමිපාණෝ

**දක්ෂිණ ලංකා කතෝලික සභාවේ පස් වන රදගුරු ලෙස වසර නවයක (1995-2004) අමිල සේවාවක් ඉටු කළ විශ්‍රාමික රදගුරු අති උතුම් ජයසූරිය කුරණගේ එල්මෝ නොයෙල් ජෝසප් පෙරේරා හිමිපාණන් පසුගියදා ස්වර්ගස්ථ විය. උන්වහන්සේගේ ජීවන තොරතුරු ළමා ප්‍රදීපයට මෙසේ අකුරු කරමි.**



නැසී ගිය ජයසූරිය කුරණගේ තෝමස් පෙරේරා මහතාට සහ නැසීගිය පල්ලියරාලලාගේ ඇග්නස් මේරි ද අල්මේ දා මහත්මියගේ පුතුණුවන් වූ අති උතුම් ජයසූරිය කුරනගේ එල්මෝ නොයෙල් ජෝසෆ් පෙරේරා මාහිමිපාණන් 1932 දෙසැම්බර් 04 වන දින හලාවත දී මෙලොව උපත ලැබීය. මෙතුමා තම මූලික අධ්‍යාපනය මාදම්පේ ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයෙන් ද මාදම්පේ රෝ. ක. සිංහල පාසලෙන් සහ ශාන්ත සෙබස්තියන් ඉංග්‍රීසි විදුහලෙන් ද, හැද-ෑරූහ. මෙහිදී දේව සේවයට හා පූජක දිවියට ඇල්මක් හා ඇරයුමක් ඇති බව තේරුම් ගත් පසු තීරණාත්මකව දේව කැඳවීම පිළිගත් මෙතුමා දේව කැමැත්තට හිස නමා 1948 දී ගාල්ල කලේගාන සාන්ත සේවියර් කුඩා දෙව්සත්හලට ඇතුලු විය. ගාල්ලේ සුප්‍රසිද්ධ ශාන්ත ඇලෝෂියස් විදුහලෙන් ද්විතීක අධ්‍යාපනය ලැබූහ.

ගාල්ලේ තම ඉගෙනුම අවසන් කර පූජක දිවියට පුහුණුව ලැබීම සඳහා 1955 දී බොරැල්ල ශාන්ත බර්නාඩ් ප්‍රධාන දෙව්සත්හලට ඇතුළ් වී නව මසකට පසු අම්පිටිය ජාතික දෙව්සත්හලට පිවිස එහිදී තම අධ්‍යාපන කටයුතු සාර්ථක ලෙස නිම කරන ලදි. 1960 දෙසැම්බර් මස 21 වන දින එවකට අගරදගුරුව සිටි පසුව ශ්‍රී ලංකාවේ ප්‍රථම කාදිනල් අති උතුම් බෙන්ජමින් කුරේ හිමිපාණන් වහන්සේ අතින් පූජක වරම් ලැබීය.

පූජක වරම් ලැබූ එතුමා තරුණ, උද්යෝගීමත් පියතුමෙක් ලෙස දේව ජනතාව අතර දූත කාර්යය සඳහා යවනු ලැබීමට සූදා-නම්ව සිටි අවදියේ එවකට ගාලු රදගුරු නිකුලා මරියා ලව්දාදියෝ හිමිපාණන්ගේ ලේකම් සහ ගාලු ආසන දෙව් මැදුරේ එවකට මීසම් සේවක ගරු එෆ්. එම්. ඩී. දමිලියා පියතුමාගේ සහායක පියතුමා ලෙසද, වැඩ බාර ගන්නා ලදි. 1963 දී කෑගල්ල මීසමේ සහායක පියතුමා ලෙසද 1964 දී රත්නපුර මීසමේ සහායක පියතුමා ලෙස ද වසරකට පසු 1965 දී බලංගොඩ මීසමේ සහායක පියතුමා ලෙස ද සේවය කරන ලදි. තරුණ එල්මෝ පෙරේරා පියතුමා මීසම භාර පියතුමකු ලෙස පළමු වරට 1967 දී බලංගොඩ කීරපත්දෙනිය මීසමෙන් තම සේවය ඇරඹීය. අවුරුදු හයක කාලයක් තම ශ්‍රමය, ශක්තිය, කාලය යොදා කිසිදු විවේකයක් නොලබා තම බැටලු රැළ වෙනුවෙන් ඉමහත් සේවයක් ඉටු කළේය. මෙතුමාගේ ත්‍යාගශීලී සේවය ලැබූ කීරපත්දෙනිය මීසම් පවුල, කිතු සමිඳුන් අනුව යාමට මගපෙන්වූ ඒ යහපත් එඩේරාණන් තවමත් සිහිපත් කරන්නේ ඉතාමත් ප්‍රීතියෙන් හා කෘතඥතාවයෙන් යුතුවය.

නවක රදගුරු අති උතුම් ඇන්තනී ද සේරම් හිමිපාණන් 1973 දී එතුමා ව ගාලු ආසන දෙව්මැදුරේ පාලක පියතුමා වශයෙන් ද ගාල්ල දිසාව භාර පියතුමා වශයෙන් පත් කරන ලදි. ගාල්ල ආසන දෙව් මැදුරේ සේවාව ආරම්භ කරමින් ගාල්ල ආසන දෙව් මැදුර ප්‍රතිසංස්කරණ කටයුතු ද සිදු කළේය. ගාල්ල ආසන දෙව් මැදුරේ සියවස් උළෙල අති උත්කර්ශවත් අයුරින් 1974 වර්ෂයේ දී සංවිධානය කරන ලද්දේ මෙතුමාගේ පුරෝගාමීත්වය යටතේය.

ගාල්ල ආසන දෙව් මැදුරේ සේවය කරන කාලයේදීම උන්වහන්සේ විසින් මෙරට කිතුනු සබැදියාවක් ඇති මුද්දර නිකුත් කිරීමේ අදහස පළමු වරට ඉදිරිපත් කරන ලදි. මේ කාලයේදී එම අදහස සඳහා එතරම් ප්‍රතිචාරයක් නොලැබුණ ද දේශීය කිතුනු මුද්දරයක් නිකුත් කර ගැනීම සඳහා අප්‍රතිහත ධෛර්යයෙන් සඟ සැපත් ගාලු රදගුරු ඇන්තනී ද සේරම් හිමිපාණන්ගේද සහාය හා අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් විශ්‍රාමික අගරදගුරු හිමිපාණන්ගේ ද අනුග්‍රහය ඇතිව 1983 වර්ෂයේදී නත්තල් මුද්දර දෙකක් සහ තවත් මුද්දර කිහිපයක්ද එළි දක්වන ලදි. මේ අනුව මෙරට කිතුනු මුද්දර නිර්මාතෘ වශයෙන් ද උන්වහන්සේගේ නාමය රන් අකුරින් ලියැවිණි. 1981 වසරේ සිට ගුරුගල්ල මීසම භාරව හා ගාලු පදවියේ සෙනට් තනතුරද අනුශාසක ලෙස ද වගකීම් භාර ගෙන කටයුතු කරන ලදි.

අති උතුම් ඇන්තනී ද සේරම් හිමිපාණන් ස්වර්ග ස්ථ වීමෙන් පසු එම තනතුරට පත්වී ආ අති උතුම් ඩබ් දොන් සිල්වෙස්ටර් රදගුරු හිමිපාණන් විසින් එතුමා රත්නපුර මීසම් පාලක පියතුමා වශයෙන් 1983 දී පත් කරන ලදි. එතුමා රත්නපුර ආසන දෙව්මැදුරේ ප්‍රතිසංස්කරණ කටයුතු ද සිදු කළ අතර රත්නපුර ආසන දෙව්මැදුරේ සියවස් උළෙල එතුමාගේ ජීවිතයේ අමරණීය සිද්ධියක් වූණි.

**ඉතිරිය 06 පිටුවෙන්**

**ගරු ලසන්ත ෆොන්සේකා පියතුමා (රදගුරු ලේකම්)**
රදගුරු මැදුර - ගාල්ල

## සග සැපත් ගාල්ල පදවියේ විශ්‍රාමික රදගුරු අති උතුම් එල්මෝ පෙරේරා හිමිපාණෝ

05 පිටුවෙන්

එම උත්සවය ගරු ගාම්භීරත්වයෙන් අති උතුම් දොන් සිල්වෙස්ටර් හිමිපාණන්ගේ අතින් ආසිරි ගන්වා කැප කරන ලදි. රත්නපුර සියවස් උළෙල සාර්ථකව පැවැත්වීම වෙනුවෙන් ගාලු පදවි ලේඛනාරක්ෂක තනතුරට පත් කිරීමෙන් පසුව රෝමයේ රාජ්‍ය ලේඛනාගාරයේ වැඩ කිරීමට මෙතුමාට ලැබුණු අවස්ථාව නිසා පදවියේ වර්ධනය පිළිබඳව හා ඉතිහාසය පිළිබඳව මනා දැනුමක් ලබා ගැනීමට හැකි විය.

1992-12-24 වන දින ගරු එල්මෝ පෙරේරා පියතුමා ගාලු රදගුරු වසමේ ප්‍රථම සහායක රදගුරු ලෙස විශේෂ බලතල ද සහිතව පත් කළ බව වතිකානුව ප්‍රකාශයට පත් කරනු ලැබ රදගුරු හිමිපාණන් රෝමයට කැඳවා 1993-01-06 වෙනිදා ශුද්ධ වූ පේදුරු තුමාගේ බැසිලිකාවේදී සුදතුම් පියාණන් වහන්සේ අතින් අභිෂේක වරම් ලැබීය. ශ්‍රී ලංකාවට පැමිණි උන් වහන්සේ ගාලු රදගුරු පදවියේ උන්නතිය වෙනුවෙන් විශාල සේවයක් කරන ලදි. ගාලු පදවියේ සහායක රදගුරු ලෙස හා අපෝස්තලික පරිපාලක ලෙස ද සේවය කළ අති උතුම් එල්මෝ පෙරේරා හිමිපාණන් අති උතුම් දෙවන ජුවාම් පාවුලු සුදතුම් පියාණන් වහන්සේ විසින් ගාලු රදගුරු වසම භාර එඩ්රාණන් වශයෙන් පත් කර 1995-06-21 වන දින පත් කරන ලදී.

අති උතුම් එල්මෝ පෙරේරා හිමිපාණන් ගාලු රදගුරු හිමි වශයෙන් පත්ව ඇත්තේ අප පදවියේ සුවිශේෂ කාල වකවානුවකය. එවකට විශ්‍රාම ලත් අති උතුම් දොන් සිල්වෙස්ටර් හිමිපාණන් විසින් ආරම්භ කරන ලද දූත සේවා සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා රදගුරු පදවියේ ගිහි, පූජක, පැවිදි එකමුතු සංඝයක් ගොඩනැගීමේ භාර ධූර කාර්යය මෙතුමාට පැවරිණි. වෙනස් වන සමාජයේ විෂමතාවන් තෝරා බේරා ගෙන, කැඩී බිඳී ගිය සහෝදරත්වය නැවත ස්ථාපිත කරමින් කැපවීමෙන්, පරිත්‍යාගයෙන්, ආදර්ශමත්ව සහයෝගයෙන් කටයුතු කිරීමට දේව ජනතාව නිසි මග ගෙන යාමට පෙර මග ගැනීමට උන්වහන්සේ මහත් පරිශ්‍රමයක් ගන්නා ලදි. 2004 වසරේදී උන් වහන්සේ ගාලු රදගුරු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදි.

ස්වර්ගස්ථ වූ ගාලු පදවි පස්වන රදගුරු අති උතුම් එල්මෝ නොයෙල් පෙරේරා මාහිමිපාණන් 1995 අගෝස්තු 10 වන දින පදවි ප්‍රාප්තවීමේ උත්සවයේදි මෙසේ ප්‍රකාශ කළහ. "දුක් කරදර මධ්‍යයේ සුභාරංචියේ සත්‍යතාවය අනුව ජීවිතය සකස් කර ගෙන යන බාල තරුණ මහලු ස්ත්‍රී පුරුෂ හැමට මාගේ පීතෘක ආදරය හා සේවය ඉදිරිපත් කරන අතර සභාවේ වර්ධනයට අවංකව සේවය කිරීමට මම අදිටන් කර ඇත්තෙමි" එම පොරොන්දු අනුව රදගුරුතුමෙක් ලෙස ගාලු රදගුරු වසමේ අමිල සේවයක් කල උන්වහන්සේට කිතුනු සසුන ද අප රදගුරු වසමේ පූජක පැවිදි ගිහි අප සියලු දෙනාද සදා ණය ගැති වෙමු. පුරා වසර 55ක් දකුණ හා සබරගමුව දෙපළාත් තුළ පූජක සේවාව තුලින් තම ජීවිතය කැප කල උන් වහන්සේට මොක් සුව ප්‍රාර්ථනා කරමු.

## යාච්ඤාව තුලින් දෙවිඳුන් වෙතට

- යාච්ඤාව තුළින් දෙවිඳුන් අමතන්න.
  එවිට එතුමාණෝ ඔබට පිළිතුරු දෙන සේක.
- යාච්ඤාව තුළින් දෙවිඳුන්ට සවන් දෙන්න
  එවිට එතුමාණෝ ඔබව ආරක්ෂා කරන සේක.
- යාච්ඤාව තුළින් දෙවිඳුන්ගෙන් ක්ෂමාව අයදින්න.
  එවිට එතුමාණන් හා ඔබ අතර බැඳීම ශක්තිමත් වනු ඇත.
- යාච්ඤාව තුළින් දෙවිඳුන් තුළ පවිත්‍ර වන්න.
  එවිට එතුමාණෝ ඔබට සමීප වන සේක
- යාච්ඤාව තුළින් දෙවිඳුන්ට ප්‍රේම කරන්න.
  එවිට එතුමාණෝ ඔබව අත් නොහරින සේක.
- යාච්ඤාව තුළින් දෙවිඳුන් පසසන්න.
  එවිට එතුමාණන්ට ඔබව ප්‍රසන්න වනු ඇත.
- යාච්ඤාව තුළින් දෙවිඳුන්ට ගෞරව කරන්න.
  එවිට එතුමාණෝ ඔබව පිළිගන්නා සේක.
- යාච්ඤාව තුළින් දෙවිඳුන්ව මහිමයට පත් කරන්න.
  එවිට එතුමාණෝ ඔබව බලවත් කරන සේක.
- යාච්ඤාව තුළින් දෙවිඳුන්ව සොයන්න.
  එවිට එතුමාණෝ ඔබව ප්‍රකාශ වන සේක.
- යාච්ඤාව තුළින් දෙවිඳුන් හඳුනා ගන්න.
  එවිට එතුමාණෝ ඔබව කැඳවන සේක.

**අයේෂා ද සිල්වා**

මාසික සිතිවිල්ල



සේයා :-
ශ්‍රීයාංගණී පිලීෂියා

**මාසික සිතිවිල්ල**


**"මැයි මාසය"**

ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

# පැවිදි වසර - 2015

## ශ්‍රී ලංකාවේ පැවිදි නිකායන් පිළිබඳ සංක්ෂිප්ත විස්තර 03

# බෝර්ඩෝහි ශුද්ධවූ පවුලේ සොහොයුරියෝ



ගරු පියෙර් බියෙන්වෙනු නොආයි පියතුමා

ප්‍රංශයේ බෝර්ඩෝර් නුවර ආරම්භ වූ ශුද්ධවූ පවුලේ සංගමයේ නිර්මාතෘ පියර් බියෙන්වෙනු නොආයි පියතුමා අපූරු යුග පුරුෂයෙකු ලෙස නම් කළ හැක. ප්‍රංශ විප්ලවයේ සුන්බුන් අතරේ හිරු සේ ආලෝකය විහිදුවමින් නැගී සිටි එතුමන්, එවකට පැවති සමාජ විපර්යාසයන්ට මහත් වූ අභියෝගයක් විය. එවකට ප්‍රංශයේ ශුද්ධවූ සභාව මහා කුණාටුවකට හසුවී දෙදරමින් සිටින අවධියක එතුමන් එම ව්‍යසනයට හසුනොවී එඩිතරව නැගී සිටියේය. ශුද්ධවූ සභාව තුළ පැවති පූජක පැවිදි නිකායන් අභියෝගයට ලක් කරමින් නව ආරක සංගමයක් ආරම්භ කිරීමට එතුමන් සිහින මැව්වේය. එහෙත් මෙය එතරම් පහසු කාර්යයක් නොවීය. සභාව තුළ ධූරාවලියක් අනුව සංවිධානය වී තිබූ බල ව්‍යුහයන් සහ ක්‍රමවේදයන් වලට විකල්පයක් වීම නිසා එතුමන්ට මහත් වූ දුෂ්කරතා වලට මුහුණ දීමට සිදුවිය. එහෙත් එතුමන් තුළ තිබූ ගැඹුරු අධ්‍යාත්මිකත්වය ඒ සඳහා නිරන්තර ජවයක් ලබා දුන්නේය.

මේ යුගයේදී සාම්ප්‍රදායිකව පැවත ආ පැවිදි නිකායන් විසින් එම යුගයේ අවශ්‍යතාවයන්වලට පිළිතුරු දීමට වඩා පවතින ධූරාවලිය රැකගැනීමෙහි නිරතවීමක යෙදෙන බව එතුමන් අවබෝධකර ගත්තේය. මේ නිසාම එතුමන් ගැඹුරු මෙනෙහි කිරීමක යෙදෙමින් සෑම විටම නාසරත්හි ශුද්ධවූ පවුල සහ මුල් කිතුනු සංඝ වල ආදර්ශය ගනිමින් එතුමන්ගේ සිතුවිලි සහ සැළසුම් වලට මහත් වූ ආලෝකයක් හා මඟපෙන්වීමක් ලබාගත්තේය. ශුද්ධවූ පවුලේ ආදර්ශය අනුව යමින්, ශුද්ධවූ පවුලේ සංගමය ආරම්භ කිරීමේ අඩිතාලම 1820 වසර වන විට සැලසුම් සකස් කරමින් තිබුණද, සභා සම්මත කරගැනීම එතරම් පහසු කාර්යයක් නොවීය. ශුද්ධවූ පවුලේ සංගමය පිළිබඳව නොආයි පියතුමාගේ සිහිනය වූයේ මහා රුස්ස ගසක ලැගුම් ගෙන සිටින පක්ෂීන් නෙක හඬින් ගායනා කළත් එතුමන්ට ඇසුනේ එකම ගීයක් ලෙසයි. (සියල්ල තුළින් දෙවිඳුන්ට පමණක් මහිමය වේවා යන්නයි) මේ විවිධත්වය තුළ වූ ඒකත්වය අගය කළ එතුමා ශුද්ධවූ පවුලේ සංගමය සියලු තරාතිරමේ ජනතාවට ඇතුලුවීමට ඉඩ කඩ සළසා දුනි. එනම්;

- පැවිදි අපෝස්තලික කණ්ඩායම
- පැවිදි ධ්‍යානපර කණ්ඩායම
- කැපවූ ගිහි කණ්ඩායම
- පූජක කණ්ඩායම වැඩිහිටි
- ගිහි සාමාජික සාමාජිකාවන් (තරුණ, ළමා වැඩිහිටි)

මෙය සැබවින්ම සංගමයකි. විවිධ කණ්ඩායම් වල සියලු දෙනා සම තත්ත්වයේ පවතින ලෙස කටයුතු කිරීමට එතුමන් වග බලාගත්තේය. සියලු දෙනා සම තත්ත්වයේ පැවතියද, විවිධ කාර්යයන් වල යෙදුනු අය වූහ. මෙවන් විවිධ වූ සංකීර්ණ ස්වභාවය ශුද්ධවූ සභාවේ නිල නායකත්වයට පැහැදිළි ලෙස තේරුම් ගැනීමට අසීරු වුවද, එහි ගැඹුරු සත්‍යයක් සහ වටිනාකමක් ඇති බව ඔවුහු දුටුහ. විවිධ ප්‍රශ්න කිරීම් හා හැලහැප්පීම් මැද නොසැලෙන පර්වතයක් සේ එහෙත් නිහතමානීව නැගී සිටි අප ස්ථාපිත පියතුමා, 1831 අප්‍රේල් 30 වෙනි දින බෝර්ඩෝහි රදගුරුතුමන්ගේ අවසරය ඇතිව ශුද්ධවූ සභාව තුළ නිළ සංගමයක් ලෙස අනුමත කරගැනීමට අවස්ථාව උදාකර ගත්තේය. පියතුමන් තුළ තිබූ නොතිත් ධෛර්යය හා සැලසුම් කිරීමේ හැකියාවද දෙවිඳුන් කෙරෙහි ගැඹුරින් මුල්බැස තිබූ යාච්ඤාවේ හා මෙනෙහි කිරීමේ ස්වභාවයද මේ සඳහා හේතු විය.

### දූත සේවාවන්

මේ අනුව විවිධ සේවාවන් වලට යොමු වූ ශුද්ධ වූ පවුලේ සොහොයුරියෝ අනාථ දරුවන් රැකබලා ගැනීම, අධ්‍යාපනය, සාත්තු සේවය, ගොවීන් සහ කම්කරුවන් අතරේ සේවය කිරීම, තනිවූ අසරණ අය සොයා යෑමේ විවිධ වූ දූත කාර්යයන්හි නිරත වූහ. වරෙක මහා සයුර මැද කුණාටුවට හසුවූ රුවල් නැවක් සේ දෙදරා යන විට, එතුමන් නැවතත් ධෛර්යය ගෙන ගොඩබිම කරා යෑමේ අධිෂ්ඨානය ඇති කරගත්තේය. මෙසේ විවිධ සේවාවල යෙදෙමින් පවත්නා සමාජයට විකල්පයක් වෙමින් ඉදිරියට යන ගමනේදී සුවිශේෂ සන්ධිස්ථානයක් ලෙස නොආයි පියතුමා තම සොහොයුරියන් ශ්‍රී ලංකාවට මිෂනාරින් සේ යවන්නට සැළසුම් කර තිබුනේ 1861 වසරේදීය. එහෙත් ඒ වන විට අසනීපව පසුවූ එතුමන්ට හැකිවූයේ සැලසුම් සකස් කිරීමට පමණි. මන්ද එම වසරේදීම එතුමා ස්වර්ගස්ථ විය.

**ඉතිරිය ලබන සතියේ**

**ගරු සංජීව ප්‍රනාන්දු පියතුමා, ජේ.නි)**
**අධ්‍යක්ෂ,**
**ජේසු නිකායික තරුණ කේන්ද්‍රය,**
**අක්කරපනහ, මීගමුව.**

# සුදතුම් පහසින් ගුණසුවඳ පතුරන

අවුරුදු 26 ක් පාසල් කටයුතු හා බැඳුණු ගරු පියතුමෙකු හට ලංකාවේ ප්‍රධාන පෙළේ කතෝලික පාසලක මීගමුව ශාඛාව ගොඩනැඟීමට කැඳවීම ලැබිණි. එහි ආරම්භකයාණන් ලෙස උන්වහන්සේට එම භාරදූර කටයුත්ත පැවරුවේ විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි. මව්පාසල ලංකාවේ නමක් තබා තිබිය දී එහි ශාඛාවක ආරම්භය තමා විසින් සිදු කිරීමට ලැබීම පිළිබඳ ව එදා ඒ පියතුමා හට දැඩි ව දැනෙන්ට ඇත.

ඒ වෙන කවුරුවත් නොව අප ආදර අදියුරු ගරු සුදත් ගුණතිලක පියතුමා ය. 2005 වසරේ පාසලේ පළමු ගොඩනැඟිල්ල සඳහා මුල් ගල තැබූ අතර උන්වහන්සේගේ දැඩි කැපවීම හා මඟ පෙන්වීම මත සාන්ත ජෝසප් විදුහල් මාතාව, මීගමුව, කඩොල්කැලේ ග්‍රාමයේ දස වසරක් පුරා ගොඩනැගෙමින් පවතී. උප විදුහල්පතිතුමිය හා ගුරුවරියන් සිවු දෙනෙකු සමඟ සිසු දරුවන්ගේ අනාගතය බාර ගනිමින් 2006 වසරේ දී ගරු සුදත් ගුණතිලක පියතුමා මෙම පාසල නිල වශයෙන් ආරම්භ කළේ ය. එම ආදරණීය මොහොත අද ද එතුමාට හොඳින් මතකයේ ඇත.

ගරු සුදත් ගුණතිලක පියතුමා දැඩි වෙහෙසක් දරා පාසල ගොඩනැඟුවේ යැයි කීමට හේතුවක් ඇත. කඩොල්කැලේ ගමේ පිහිටි අප පාසල් වත්ත එවකට පැවතියේ කිසිවක් ගොඩ නො හැකි මඩ වගුරක් ලෙස ය. මහා පරිශ්‍රමයක් යොදා පාසල් භූමියක් ලෙස සුදුසු තත්ත්වයට ගැනීමට උන්වහන්සේට සිදු විය. සෑම අභියෝගයක් ම උන්වහන්සේ දේව අභිමතය පරිදි ජයග්‍රහණය කර ගත් බව අද පාසල දැකීමෙන්ම අපට අවබෝධ වේ. පාසලක් ඉදි කිරීමට වඩා මෙතරම් කෙටි කාලයක දී මෙවැනි ගණයේ පාසලක් ගොඩ නැඟුනේ ගරු සුදත් ගුණතිලක පියතුමා නිසා බවට කිසිදු තර්කයත් අපට නැත. උන් වහන්සේ මෙම පාසල ගොඩනඟන්නට හෙළූ කඳුළු මේ පොළව යට නිදන් ගත වී ඇත. මවක තම දරුවා ව වදා, පණ මෙන් රැකගෙන, උස්මහත් කරන්නේ යම් සේ ද උන් වහන්සේත් දැඩි මහන්සියක් දරා මෙලොවට බිහිකර හදා වඩා ගත් දරුවෙක් සිටියි. ඒ සාන්ත ජෝසප් විදුහලයි.



දස වසරක් පුරා පාසල ගොඩ නැඟුවා යැයි පවසවාට වඩා පුංචි පවුලක් ගොඩනැඟුවා යැයි පැවසීම සුදුසු ම යැයි මට සිතේ අප පවුලේ පියා අප ආදර ගරු සුදත් ගුණතිලක පියතුමා ය. ජේසුතුමා ව හා මරියතුමිය ව රැකබලා ගත් සුරැකි පියා ශුද්ධ වූ ජුසේතුමා වූවා සේ ම එතුමන්ට කැප වූ අප පවුලේ සුරැකි පියා අප ආදර පියතුමා ය. පාසලේ කිසිදු වැඩක් උන් වහන්සේ අතින් මගහැරී නැත. සෑම අවස්ථාවක ම අපට මඟපෙන්වන්නේ එතුමා ය. සිසු දරු දැරියන්ට, ගුරුවර ගුරුවරියන්ට මෙන් ම අනෙකුත්







# ා තිලකය නුඹයි



සේවක සේවිකාවන්ට ද දිය හැකි උපරිම පහසුකම් සලසා දී ඇත.

ගරු සුදත් ගුණතිලක පියතුමා නිතර ම පවසන එක වදනක් ඇත. "මම විදුහල්පති කෙනෙකු වීමට පළමු ව පියතුමෙක්" ය යන්නයි. සැබවින් ම එය එසේ ම ය. මා දකින්නේ උන් වහන්සේගේ සැබෑ නායකත්වයයි. ඒ නායකත්වය තුළ එතුමාගේ බැහැපත්ක ම නිතර ම පිළිබිඹු වේ. තවත් අකාරයකට පැවසුව හොත් උන්වහන්සේ සතු භූමිකා රාශියකි. විටෙක විදුහල්පති පියතුමා ලෙස මුළු පාසල ම පාලනය කරයි. අනාගත සැලසුම් සකස් කරයි. සිසු දරුවන් මූලික කරගනිමින් ක්‍රියා කරයි. තවත් විටෙක ආදර පියතුමෙකු ලෙස ජේසුස් වහන්සේ ඉගැන්වීම් අපට පහදා දෙයි. පාසල තුළ ආගමික පරිසරයක් ඇති කිරීමට කටයුතු කරයි. තවත් විටෙක හිත මිතුරකු ලෙස අප හා අත්දැකීම් බෙදා ගනී. හඬ නගා සිනාසෙයි. සියල්ල තුළ අප දකින්නේ ප්‍රේමාන්විත දේව පුත්‍රයෙකි.

ඉතිරිය 10 පිටුවේ....

**දිස්නා සඳමාලි**
**(ආචාර්ය මණ්ඩලය)**






## සුදත් ඇදුරු පියතුමෙනි

නිතින සරණ බැතියෙන අප හට පුදනා
සුදන දරන ගුණ කඳ අයිතිව හිඳිනා
හොඳින හැඳින දාරක සිත මතු දිලෙනා
පුදන ගුණෙන යශ ඔබ පින්වතෙකි මනා

සුදත් ගුණතිලක පියතුමෙනි අති සොඳ
සරත් කලෙක පිපි ඔබෙ මහරු ගුණ කඳ
ඔබත් දිලෙයි නිබඳ ව රැයෙහි සොමි සඳ
අදත් හෙටත් වැජඹේ අමිල සුව විඳ

පෙම්බර ඔබට නිරතුරු දෙවි වරම් ලැබේ
ඒ සුර ගුණෙන් ඔබ රජ වේ දියත සබේ
පින්සර ඔබට දෙව්මව්ගේ නුවන් ගැබේ
සුන්දර බැල්ම හැමදාමත් හොඳින් ලැබේ

මඩ ගොහොරකට සුර විමනක සිරි කැන්දු
සැඩ සුළඟට ද නොබිය ව, සිරිදුව රැන්දු
වඩ නඩ සිරිය තව තව අසිරිය බැන්දු
වෙඩරු පිඩක වේ ඔබෙ හද සිරි වින්දු

දස වසරක පමණ සේවය නොමැන කුඩා
ඇස පාදන්ට නව සිසුනගෙ දුරිල විඩා
හසරැල් ඔබේ තුති පිනිබිඳු කර ඒ කඩා
ඉස පෙරමඟට නමදිමි ඔබ බැතිනි වඩා

සත වෙන කුළුණු සිත පෑ ගරු පියාණෙනී
මෙත වඩ වඩා ඔවදන් දුන් විලාසෙනී
සෙත සිප් උගැන්මට දුන් ඇදුරුවාණෙනී
සිත සොඳ ඔබට තුති වේ ගරු පියාණෙනී

**කවින් සිරිවර්ධන**
09 ශ්‍රේණිය - සා. ජෝශප් හාබා විදුහල , මීගමුව

# සුදතුම් පහසින් ......

8-9 පිටුවෙන්..

නිතර ම කතෝලික පාසලක් ය යන හැඟීම පාසල තුළත් ඉන් බාහිරවත් ඇති කිරීමට උන්වහන්සේ වෙහෙසෙයි. සෑම කටයුත්තක ම ආරම්භයත් අවසානයත් යාච්ඤාවෙන් සලකුණු කිරීම අනිවාර්ය අංගයකි. උදෑසන පාසලට ඇතුළු වන අප මඳක් නවතින එක් තැනක් ඇත. ඒ ජේසු කුමරුගේ අතින් අල්ලාගෙන සිටින ශුද්ධ වූ ජුසේ මුනිදුන්ගේ ප්‍රතිමාව අසලයි. ගරු සුදත් ගුණතිලක පියතුමා ද අනිවාර්යයෙන් ඒ අවට රැඳේ. උන් වහන්සේට සුබ උදෑසනක් ප්‍රාර්ථනා කොට තවත් මිනිත්තුවක් හෝ දෙකක් හෝ රැඳෙමින් එතුමා සමඟ සුහද කතාබහක යෙදෙන්නට අප අමතක කරන්නේ ද නැත. උන්වහන්සේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි කිසි අඩුවක් නො වීමට කටයුතු කරයි. එපමණකක් නො ව ක්‍රීඩා හා අනිකුත් බාහිර ක්‍රියාකාරකම් ද දරුවනගේ පැවැත්මට අත්‍යවශ්‍ය දෙයක් බව උන්වහන්සේ විශ්වාස කරන අතර ඒ සඳහා සියලු පහසුකම් දරුවන්ට සපයා දී ඇත.

සෑම කතාවක ම අවසානයේ මෙසේ සටහන් වේ. "හැම හමුවීමකම අවසානය වෙන්වීම වේ." අදියුරු ගරු සුදත් ගුණතිලක පියතුමන් පිළිබඳ ව ලිවීමට ඇත්තේ ද මෙ පමණක් නොවේ. උන්වහන්සේගේ හැර යාම කෙමෙ-න් කෙමෙන් ළඟා වෙද්දී අප හදවත්වල එතුමා ගැන ඇති ඉඩකඩ වැඩි බව අපට දැනේ. දස වසරක කාලය තුළ පාසල් ගොඩනැගිල්ලකට වඩා ශක්තිමත් යදමකින් උන්වහන්සේගේ ආදරය අප ශක්තිමත් කරමින් බැඳී ඇත. තවද මැයි 21 වන දින සිය උපන් දිනය සැමරූ ගරු පියතුමාට පාසලක් වශයෙන් අප ශුභ පතන්නෙමු. එහෙත් සාන්ත ජෝසප් මීගමුව ශාඛා විදුහල් මාතාව හැරදා උන්වහන්සේට නික්ම යාමට සිදුව ඇත. එක මොහොතකින් සියල්ල හැරදා, කැඳවීම ලත් තැනට යාම පූජක දිවියේ උරුමයයි. මුළු පාසල් මාතාව ම උන්වහන්සේට සමු දිය නො හැකි ව බලා සිටී.

ගරු සුදත් ගුණතිලක පියතුමෙනි, ඔබ වහන්සේට තනිව ම යාමට ඉඩ දීමට අපට නො හැකි ය. දස වසරක් පුරා ඔබවහන්සේ ගොඩ නගා දුන් පවුලේ අපගේ සදා ආදරය ඔබ වහන්සේ සමඟ එවමු. රන් මිනි මුතු මැණික්වලට වඩා ඒවා ඔබ වහන්සේ ට අගනා ත්‍යාග වේවි. දේව පුත්‍රයා සියල්ල හැරදා මෙලොවට පැමිණියේ දේව කැමැත්ත උදෙසා ම ය. ඔබවහන්සේගේ කැඳවීමත් දේව අභිමතය පරිදි යැයි කඳුළින් වුවත් අප විශ්වාස කරන්නෙමු. ආදර පියතුමෙනි, ඉතින් අපට අවසරයි, ඔබ වහන්සේට සමු දීමට. එහෙත් ඔබ වහන්සේ ගැන වූ ආදරණීය මතකය අප හදවත් තුළින් කිසිදා නොමැකේවි..... ඔබ වහන්සේට ජේසු පිහිටයි !

# අප ආදර දේව අම්මේ....



**මරියතුමී විශ්වයේම අම්මාය. මරිය තුමීයගේ ආදරය මහා සාගරයක් වගේය. මහාසාගරයේ රැළි අප වෙත එනවා වගේ එතුමියගේ ආදරය අප වෙත ගලා එයි. එතුමියගේ ආදරය නිසා පුංචි අපේ ජීවිත එළිය වෙනවා. මරියතුමී අපට පෙන්වූ පරිදි ජපමාලය උච්චාරණය කිරීමට අප පුරුදු වෙන්නට ඕනෑ. එවිට ජේසු අම්මාට ළංවෙන්න අපට පුළුවන්.**

**අෂිනි චාමිකා -** 05 ශ්‍රේණිය
ශා. මරියා දහම් පාසල - හාල්දඩුවන

වළාකුළු අතරින් අප තුරුළු කරන් සිටි අම්මේ ....
බැහැපත්කමින් අප හට සෙනෙහස දැක්වූ අම්මේ ....
සැමවිට අපව යහ මඟ ගෙන ගිය අම්මේ .....
සමිඳුගෙ පහස ලැබුමට අප ගෙන යනු අම්මේ .....

**වර්ජින් පිපුනි නිමාෂා**
09 ශ්‍රේණිය - සිරිකුරුස විදුහල - ගම්පහ


**සිහින පොදි බැඳගත් තුරුණු නඳක්**
**අනාගතය ආලෝකවත් කරන්නට සිතූ යුවතියක්**
**සොඳුරු දිවියක් සිහිනයෙන් පවා පැතූ සොඳුරු සිතැත්තියක්**
**කෙලෙස ගැබ් දරන්දේ කන්‍යාවක් අයුරින්**

**ස්වර්ණමය මන්දිරයක් නොවේය ඔබේ දිළිඳු පැළ**
**රාජ භෝජනයක් නොවේය වුයේ ඔබේ අහරවල**
**දිළිඳු වඩුවෙකි ඔබේ ප්‍රිය ස්වාමි සඳ**
**කෙලෙස මිනිසුන් දකින්දේ ඔබ රැජිණක් ලෙස**

**පොළවේ පස ගසා ජීවත් වූ ළඳකි ඔබ**
**නැගේ අභිමන් ඔබ ගැන සිතන හැම වර**
**යදිමි මම ගෙවනට දිවියක් මේ පොළව මත**
**අම්මේ ඔබගේ සෙවනැල්ලේ උණුසුම යට**

**රිෂ්ණී රොෂෙල්කා (ආචාර්ය මණ්ඩලය)**
සඳසරණ දහම් පාසල - විජය කටුපොත
(අඟුණවිල මීසම)

# අපේ ශරීර කඩා නැවත ගොඩ නගන්නට පවරා දෙමු



නිරන්තරයෙන්ම අප උත්සහ දරන්නේ අපේ සිතැගි පරිදි ශරීර පවත්වා ගෙන යාමටය. එවැනි අවස්ථාවන්හිදී අප ලෞකිකත්වයට නැඹුරුව දැනුවත්ව හෝ නොදැනුවත්ව පාපයේ දොරටු තුළින් ඇතුළත්ව මංමුලා වන අවස්ථා එමටය. ආදර දරුවනේ අප කෙදිනකවත් අපගේ හදවත් ඇතුළාන්තයෙන් අප යන මාර්ගය නිවැරදිද කියා විමසා තිබේද? කෙසේ නමුදු අප සිතාසිටින්නේ අප යන මාර්ගය නිවැරදිම මඟ කියාය. එය වඩාත් තහවුරු කර ගත හැක්කේ එම මග ගොස් අතරමැදකදී යම් ගැටළුවකට මුහුණු පෑ විටය. එවන් අවස්ථාවන් හිදීත් අප යොමු වන්නේ ඒ, ඒ, ගැටළු සඳහා දෙවි පියාණන් වහන්සේ මගින් හාස්කමක් ලෙස පිළිතුරු (සහනය) ලබා ගැනිමටය. නමුත් අප නොකළයුත්තේද එයමය.

ශුද්ධවු සුවිශේෂයෙහි (ජොහාන් 2:19- 24) සඳහන් පරිදි, ජේසුස් වහන්සේ එහි "මේ දේව මාලිගාව කඩා දමන්න තෙදිනකින් මම එය ගොඩනග න්නෙමි"යි වදළ සේක. එහිදි දේව මාලිගාව ලෙස සමකලේ තම ශරීරයටය. එබැවින් අපගේ ශරීර නැමති දේව මාලිගා කඩා බිඳ දමා ඒවා නැවත සකස් කිරීමට දේව හස්තය වෙත බාර කිරීමට අප සුදනම්ද නැත. අප මේ වන විට ලෞකික රාජ්‍යය ගොඩ නගමින්, එම ජීවිත වලට අනුගතව සිටින බැවින්, ආත්මික දිවියකට යොමු වීමට මදක් පැකිලෙන්නෝ වී ඇත්තෙමු. එබැවින් ප්‍රථමයෙන්ම කළ යුතුව ඇත්තේ ඒ පිළිබඳව මනස්ථාපනය වීමය. ආදර දුවේ, පුතේ, කිසිවිටෙක හාස්කමක් තුළින් දේව ප්‍රේමය අත් දකින්න උත්සහ නොදරන්න.

සුපුවත තුළ දේව මාලිගාවක් ලෙස ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය පෙන්වා දෙයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මුනෂ්‍ය ශරීරය තුලින් දෙවි පියාණන් වහන්සේ ප්‍රබල ලෙස ප්‍රකාශ වු බැවින් සැබෑ වන්දනාවේ කේන්ද්‍රස්ථානය හෙවත් සැබෑ මාලිගාව ක්‍රිස්තුන් වහන්සේය. එබැවින් මා ආදරණීය දරුවනේ හාස්කම් වලට වඩා විශ්වාසය මුලික කොට ගෙන ඇදහිල්ලෙන් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමය අත් දකිනු පිණිස අප පවිත්‍ර වීමට සිතට ගෙන කටයුතු කළ යුතුය.

නොයෙක් ආකාරයේ දුර්පරීක්ෂාවන් පහකිරීම සඳහා අප දෙවියන් වහන්සේගේ වචනයට අනුකූල දිවියක් ගත කළ යුතුය. තවද පාපයේ මාවත් වල ගමන් කරමින් විනාශ මුඛයට ඇදවැටී සිටින වැඩිහිටි අප මෙන්ම ඔබේ සම වයසේ මිතුරු මිතුරියන් පවා ඔවුන්ගේ දේව මාලිගා නැමති ශරීර කඩා පවිත්‍ර මාලිගා සාදු ගැනීමට පසුබානවා විය හැක. එවැනි අය හට සත්‍ය වටහා දී පවිත්‍ර මාලිගා ලෙස ඒ ශරීර ගොඩනගන්නට ඔබටද උපකාර කළ හැකිබව සිහියේ තබාගෙන කටයුතු කළ යුතුය. එමෙන්ම වඩාත් එලදයි වන්නේ අප පවිත්‍ර මාලිගාවක් බව අන් අයට තහවුරු වන අයුරින් මේ දිවි ගෙවීමය.

නිරන්තරයෙන් පාපයේ මාවත් කරා යොමු වන දොරටු, දොරගුළු දමා වසා දමන්නට නිති කටයුතු කරන්නට වෙර දරමු. ඒ තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයෙකු ලොවට දායාද කරන්නට වෙර දරමු.


ආශා පෙරේරා නැන්ද - කෙරවලපිටිය

## ආදර දේව අම්මා

**චමුදි දේශිකා**

10 ශ්‍රේණිය

සිරිකුරුස විදුහල - ගම්පහ





## ශු. ඔදිලියා මුනිතුමිය

**අන්ජලෝ ඩිල්ෂාන්**

06 ශ්‍රේණිය

ශු. ඔදිලියා දහම් පාසල - කම්මල


(බෝලවත්ත මීසම)

## අපගේ ආත්මීය භෝජනය

**හිරුණි කෞෂල්‍යා**

10 ශ්‍රේණිය

ක්‍රිස්තු රජාණන්ගේ දහම් පාසල - උළුඅම්බලම




## අපගේ ගැළවුම් කරුවාණෝ

**ට්‍රෙවෝන් ශෙනන්**

08 ශ්‍රේණිය

ශා. පාවුළු දේවස්ථානය

නෙලුම්පිටිය (දලුපත මීසම)








## ශු. අසීසියේ ප්‍රැන්සිස් මුනිතුමා

**කෞෂල්‍යා දිල්රුක්ෂි**

10 ශ්‍රේණිය

වන්නිමඩු දහම් පාසල - (අගුණවිල මීසම)

## මෝස්තරයක්


**චාරුක දිල්ෂාන්**

11 ශ්‍රේණිය

සා. මරියා


දහම් පාසල

හාල්දඬුවන



# ශු. බෙනඩික් මුනිතුමා



උම්බ්‍රියා රටේ නුර්සියා නමැති කුඩා ග්‍රාමයේ වංශවත් දෙමව්පියන් ගෙන් බෙනඩික් උපත ලැබුවේය. එහෙත් අනෙක් තරුණයන්ගේ අශිෂ්ටාචාර ජීවිතයන් නිසා බෙනඩික් වයස 16 දී ගැලවීම සෙවීම සඳහා තම ධනය සියල්ලද, මෙලෝ ආශාවන් සියල්ලද අතහැර දමා සැඟවී ගුහාවක වනවාසියෙක් සේ හුදකලා ජීවිතයක් ගත කළේය. ඔහු බොහෝ දුර ඇවිද සුබිආකෝ නම් වූ කඳු ප්‍රදේශයට පැමිණියේ ය. ඔහු ගැඹුරු නිශ්ශබ්ද නිම්න යක් දුටුවේය. එහි ගුහාවක් දැක ඒ වෙතට ගියේ ''ස්වාමින් වහන්සේට ප්‍රශංසා වේවා''යි ගායනා කරමිනි. එහි ගිය විට ''දැනුත් සඳහටත්'' කියා යම් හඬක් ඇසුණු විට බෙනඩික් තිගැස්සුනේය. එවිට ඔහු වටපිට බලන්නට විය. ඒ අවස්ථාවේදී ස්වල්ප දුරක වයස්ගත තාපසයෙක් සිටිනු දුටුවේය.

බෙනඩික් තමාට හුදකලා ජීවිතයක් ගත කිරීමට තිබෙන ආශාව මේ තාපසයාට පැවසීය. තාපසයාද තරුණයාට සවන් දී, ඔහුට වන වාසින් පළඳින රළු හම් ඇඳුමක් දුන්නේය. දිළිඳුකම, හිඟ පාඩු ඇතිව සිටීම, සීතල සහ නොයෙක් අපහසුකම්, තනිකම හා යාච්ඤාව මේවා මගින් ඔහු අදහස් කළේ තමා දමනය කර දෙවියන් වහන්සේට වඩ වඩා ළංවීමය. බෙනඩික් සිතුවේ මෙවැනි පරිසරයක දෙවියන් වහන්සේට ළංවීම පහසු බවය. නමුත් යක්ෂයා නොයෙක් මාර්ග වලින් ඔහු පරීක්ෂා කළේය. බොහෝ අවස්ථා වලදී ඔහුට මාංශික පරීක්ෂාවල් පැමිනෙව්වේය. එහෙත් නොයෙක් පශ්චාත්තාපි ක්‍රියා මගින් ඔහු මේවා දුරු කළේය. යාච්ඤාව හා පශ්චත්තාපය ඔහුගේ දෛනික ආහාරය විය. මෙලෙස ගල්ගුහාවේ ගත කල අවුරුදු 3ට පසු ඔහුගේ චිත්තය හා චරිතය වේගයෙන් වර්ධනය වී ප්‍රබල වුයේය. ඔහුගේ ශුද්ධවන්තකමත්, නොයෙක් ප්‍රාතිහාර්යයන් කිරීමේ බලය සහ අන් අයට මග පෙන්වීම ගැන අවට සිටින අයට දැනගන්නට ලැබී බොහෝ අවංක අනුගාමිකයෝ ඔහු වෙතට ආකර්ශණය වුහ. ඔවුන් ආරාම 12 ක පදිංචි කෙරෙව්වේය. එක් එක් ආරාමයක එයට අයත් ශ්‍රේෂ්ඨතුමා සහ තාපසයන් 12 ක් බැගින් නිවාසගත කළේය. මෙලෙස ඔහු තාපස ජීවිතය ආරම්භ කළේය.

මේ හැර ශු. බෙනඩික් තුමා තරුණයන්ගේ ක්‍රිස්තියානි අධ්‍යාපනය සඳහා පාසල් පිහිටෙව්වේය. ඔහුගේ සඵලත්වය දුටු සමහරු ඊර්ෂ්‍යාවෙන් ඔහුට සතුරු කම් කරන්නට පටන් ගත්තේය. එබැවින් ක්‍රි.ව. 529 දී ඔහුගේ අනුගාමික ප්ලසිඩස්ගේ පියාගෙන් ලැබුණු තෑග්ගක් වන මොන්ට කැසිනෝ නම් ස්ථානයට ගියේය. එතැන්හිදීද ඔහු බෙනඩික්තානු නිකායේ මව් ගෘහය වූ විශාල තාපසාරාමය ගොඩනැගුවේය. මේ අලුත් ගොඩනැගිල්ල රෝමයේ නේපල්ස් යන ගමන් මාර්ගයක කඳු මත ඇති ආලෝකය විහිදුවන පහන් කණුවක් මෙන් විය.

ක්‍රි.ව. 526 දී බෙනඩික් තුමා ලියු ව්‍යවස්ථා මාලාවේ අරමුණ වුයේ සුවිශේෂක අනුශාසනා අනුව තාපසයන්ගේ විනය හා ආත්මික හැඩගැස්මය. එයින් විශේෂ යෙන් පැතුවේ ජීවමාන සාමුහික ජීවිතය හා ප්‍රීතිදායක කීකරුකම ය. තවද ඒ නියෝග වලින් කීකරුකම යටතේ වෙහෙස මහන්සියෙන් වැඩ කිරීමේ වටිනාකම එතුමා පෙන්වා දුන්නේය. මන්ද අලස මිනිසෙකුගේ ආත්මය තුළ දේව වරප්‍රසාදය ක්‍රියා කරන්නේ නැත. එසේ උද්යෝගිමත්ව ක්‍රියා කිරීමට එකතු කළේ යාච්ඤාව, දේව වන්දනාවට අයත් ඔපිස් යාච්ඤාව සහ වෙනත් යාච්ඤා අභ්‍යාසයන්ය. වංශවත් සිටුවරුද, සාමාන්‍ය දිළිඳු අයද, බෙනඩික් තුමා විසින් ආරම්භ කළ මේ නිශ්චල, ශ්‍රේෂ්ඨ සමබර ජීවිත ක්‍රමයට ආකර්ෂණය වුවෝය.

ගොත්වරුන්ගේ රජවූ ටොටිලා පවා බෙනඩික්තුමාගේ මේ සේවය කොතරම් අගය කළේද කිවහොත්, ඔහුගේ කෲර වනචාරි ගති දමනය කළේය. ශු. බෙනඩික් තුමා ස්වර්ගස්ථ වුයේ ඔහු තාපසාරාමයේ මහා අල්තාරයේ ඉදිරියේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ පසු අත ඔසවමින් යාච්ඤා කරමින් සිටි අවස්ථාවේදීය. ඔහුගේ නිකාය ශු. සභාවට ශුද්ධෝත්තම පාප්වහන්සේලා 24 ක්ද, රදගුරුතුමන්ලා 4600 ක් ද දානය කර ඇත. මේ හැර මුළු මිනිස් සංහතියටම එතුමා දේව වන්දනාව හා ධර්මදානය මගින් කිව නොහැකි තරම් සේවයක් කර ඇත. එතුමාගේ මංගල්‍යය ජුලි 11 වන දිනට යෙදේ.

**අසේල දසනායක**

## දිළෙන මිණි මුතු

# දැල් පන්දුවෙන් විදුහල් මාතාවට කීර්තියක් ගෙනා ක්‍රීඩිකාවක්



මොරටුව ජයලත් අප ස්වාමිඳුවගේ කන්‍යාරාමයේ ඉගෙනුම ලබන ඇම්. වත්සලා මධුවන්ති පෙරේරා දැල්පන්දු ක්‍රීඩාවෙන් විශිෂ්ට දස්කම් දක්වන ක්‍රීඩිකාවකි. මෙම වසරේදී උසස් පෙළ විභාගයට පෙනි සිටින ඇය 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටියදී පාසලේ දැල්පන්දු කණ්ඩායමට එක් විය.

ඊට අමතරව තම පාසලට අනුබද්ධ වික්ටෝරියන් දැල්පන්දු සංගමයට සම්බන්ධව ක්‍රීඩා කරමින් තම හැකියාවන් ප්‍රගුණ කළ වත්සලා 2011 - 2012 වසර වල පාසල් දැල්පන්දු තරඟාවලියකට සහභාගී වී තම පාසල් කණ්ඩාමයට නායකත්වය දුන් ඇය ප්‍රථම ස්ථානය තම පාසලට ලබා දුන්නේය.

පිළියන්දල කලාප අධ්‍යාපන කාර්යාලය පාසල් මට්ටමින් සංවිධානය කළ දැල්පන්දු තරඟාවලිකට සහභාගී වූ ජයලත් අප ස්වාමිඳු බාලිකාවන්ට එහි අනු ශූරතාවය ලබා ගැනීමට නායකත්වය දුන්නේද වත්සලාය. දැල්පන්දු ක්‍රීඩාව තුළ ඇයගේ හැකියාවන් හා දක්ෂතා හඳුනාගත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා බලධාරීන් 2014 ජනවාරි මාසයේදී ඇයව ශ්‍රී ලංකා පාසල් කනිෂ්ඨ දැල්පන්දු කණ්ඩායමට තෝරා ගනු ලැබීය. මෙහිදී මෙම ජාත්‍යන්තර තරඟා වලියේදී අනු ශූරතාවය දිනා ගැනීමට ශ්‍රී ලංකා දැල්පන්දු කණ්ඩායමට හැකිවුණි.

තම ක්‍රීඩා දිවියට අතහිත දෙන විදුහල්පතිනි ගරු සුජීවා නෝනිස් පැවිදි සොහොයුරිය, දැල්පන්දු පුහුණුකරු බියංකා මානෙල් ගුරුතුමිය ඇතුළු රසිකා රුලිගු, සන්ධ්‍යා විජේසිරි යන ගුරු මහත්මීන්වද, තම ආදර දෙමාපියන්වද ගෞරවයෙන් ඇය සිහිපත් කරන්නීය. ඇය විල්ලෝරාවත්ත මීසමේ දියණියකි. වත්සලා මධුවන්ති හට ළමා ප්‍රදීපය සුභ පැතුම්.

**ට්‍රිසල් එෆ්. මැන්දිස්**
**විල්ලෝරාවත්ත**

---

# මගේ හොඳම මිතුරා ඔබයි...



ජේසුව මා හඳුනා ගත්තේ දේව වචනය තුළින්ය. ජේසුව මා හඳුනා ගත් දවසේ සිට මගේ මුළු ජීවිතයම වෙනස් වී ඇත. දේව වචනයට අනුව මා ජීවත් වන බැවින් මා අවට සිටින සියළු දෙනාටම මම ගොඩක් ආදරෙයි. තම දෙව්පියාටත්, දෙමව්පියන්ටත් ප්‍රසන්න ජීවිතයක් ගත කිරීමට උන්වහන්සේ මට කියා දෙනවා. මට උදව්වක් අවශ්‍ය වූ සෑම අවස්ථාවකදීම ජේසු මා ළඟින්ම සිටිනවා. ජේසු මා ළඟ සිටින විට දැනෙන ආදරය මට කියා නිම කිරීමට නොහැකිය. මරියතුමී සහ ජුසේ තුමාට කීකරුව ජීවත් වුවාක් මෙන් මටත් අම්මාටත්, තාත්තාටයි කීකරුව ජීවත් වීමට කියා දෙනවා. ස්වර්ග රාජ්‍යය ගැන මට කියා දී අනන්ත ජීවිතය ගැන බලාපොරොත්තු ලබා දෙනවා. දිනපතා යාච්ඤා සහ ගීතිකා මඟින් මම ජේසුට කතා කරනවා. යක්ෂ පරීක්ෂා වලින් මාව ආරක්ෂාකරනවා. ජේසු මා ළඟින්ම සිටින නිසා මම බය නැහැ. මගේ හොඳම මිතුරා ඔබයි ආදර ජේසුනි......

**සෙනුමි මිස්ටිකා**
04 ශ්‍රේණිය
සා. ජුඩ් දහම් පාසල - මත්තෙගොඩ, (පන්නිපිටිය මීසම)

# කුලියාපිටිය ජාතික පාසලේ කතෝලික ළමුන්ගේ ඔසුපැන් දන්සලක්



වෙසක් පෝය නිමිති කොටගෙන සිල්සමාදන්වූ කුලියාපිටිය ජාතික පාසලේ බෞද්ධ සිසුන් 3000 කට අධික පිරිසක් සහ ආචාර්ය මණ්ඩලය වෙනුවෙන් මෙවරත් විද්‍යාලයීය කතෝලික අංශය විසින් ඔසු පැන් දන්සලක් පැවත් වුණි. දරුවන් දිරිගන්වමින් සියලු කටයුතු සංවිධානය කරනු ලැබුයේ කතෝලික විෂය බාර ප්‍රින්සි මොරගොඩ මහත්මිය විසිනි. මේ සඳහා විද්‍යාලයේ ලක්මාල් ලිවේරා ගුරු පියාණන් ඇතුළු බොදුනු ගුරු භවතුන්ගේද නොමද සහයෝගය ලැබුනි. මෙහි අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

**රීටා සේනානායක**

# ප්‍රහේලිකා අංක 52

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | | | 2 | ■ |
| | ■ | ■ | ■ | | ■ |
| 3 | 4 | | ■ | | ■ |
| ■ | | ■ | 5 | | 6 |
| 7 | | | | ■ | |
| | ■ | ■ | | ■ | |

### හරහට

1. මිසර දේශයේ වහල් සේවයේ යෙදුනු ඊශ්‍රායෙල් ජනතාව දේව සුරක්ෂිත බව අත්දකිමින් මෝසෙස් තුමාගේ නායකත්වයෙන් යුතුව පොරොන්දු දේශය කරා ගමන් කිරීම ආරම්භ කරන අයුරු ශු. බයිබලයේ මෙම පොතේ විස්තර කරයි.

3. ක්‍රිස්තුන් වහන්සේ විසින් පේදුරු තුමාට ස්වර්ග රාජ්‍යයේ මෙය භාර දුන්සේක

5. ක්‍රිස්තුන් වහන්සේගේ උපතින් පසු, හෙරෝද් රජු ළදරු කුමරු මරා දැමීම සඳහා ........ අවුරුදු දෙකක් වුද ඊට අඩු වු ද සියළු පිරිමි දරුවන් මරා දැමීමට අණ කලේය. මෙහි හිස් තැනට සුදුසු වචනය

7. ක්‍රිස්තුන් වහන්සේගේ උපත එඬෙරුන්ට දැනුම් දුන් දේව දූතයා මෙසේ කිවේය. ''රෙදි වලින් ඔතා ගව ඔරුවක සිටින බිළිඳෙක් ඔබට සම්බ වන්නේය. එය ඔබට ............ ය''. මෙහි හිස්තැනට සුදුසු වචනය

### පහළට

1. ''ඔබේ වැටීමට හේතුව ඔබේ පාදය නම් එය කපා දමන්න. දෙපා ඇතිව අපායට හෙලනු ලැබීමට වඩා තොරව ජීවනයට ඇතුළු වීම යහපත'' මෙහි අපායට සමාන වචනයකි.

2. ක්‍රිස්තුන් වහන්සේ මෙලොවේදී බොහෝ දේ සිදු කළේ දේව .......... උදෙසා . මෙහි හිස්තැනට සුදුසු වචනය

4. යහපත් සමරිතානු වරයාගේ උපමාවේ , එම සමරිතානු වරයා, සොරුන්ට අසුවූ මිනිසාට මිදියුෂ ගල්වා ඔහුගේ ........... බැඳ කොටළුවා පිටේ තානායමට ගෙන ගොස් භාර දුන්නේ. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ක්‍රිස්තුන් වහන්සේ ස්නාවක ජුවාම්තුමා ගැන සෙනගට කතා කරමින් ''ඔබ කුමක් බැලීමට ...........ට ගියහුද? සුළඟට සැලෙන බට ගසක්'' යි ප්‍රකාශ කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ක්‍රිස්තුන් වහන්සේ ප්‍රේමය මුල්කරගෙන ක්‍රියා කිරීම නිසා මෙය කැඩුවේයැයි පරිසිවරු උන්වහන්සේට චෝදනා කලේය.

**මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ශු. ලූක් 2/12, 10/ 34, 7/18, 6, ශු. මතෙව් 2/16 , ශු. මාක් 9/45**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා – කිරිමැටියාගාර**

# ප්‍රහේලිකා අංක 51

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 එ | ළි | 2 ද | 3 ර | වි | 4 ව |
| ලි | ■ | 5 ස | තු | ■ | හ |
| යා | ■ | ප | ■ | ■ | න් |
| ■ | 6 ජ | 9 න | කා | 7 ය | ■ |
| ■ | ල | ත | ■ | 8 කු | ස |
| 9 ළ | ය | ■ | ■ | න් | ■ |

## ප්‍රහේලිකා අංක 51 - ජයග්‍රාහකයෝ

- **පළමු ස්ථානය**

  විමාෂා ප්‍රියංජලි - 08 ශ්‍රේණිය
  ශා. අන්තෝනි දහම් පාසල - බත්තුළුඔය (අගුණවිල මීසම)

- **දෙවන ස්ථානය**

  මිනුර සසංජන ප්‍රනාන්දු - 09 ශ්‍රේණිය
  ශා. තෝමස් දහම් පාසල - මහව

- **තෙවන ස්ථානය**

  නිශානි ප්‍රබෝධා බණ්ඩාරනායක - 08 ශ්‍රේණිය
  සිරිකුරුස විදුහල - ගම්පහ

# හල්පේ ශු. ෆ්‍රැන්සිස් සේවියර් පෙර පාසලේ අවුරුදු උලෙළ



හල්පේ දේවස්ථානයට අනුබද්ධිතව ඇති හල්පේ ශු. ප්‍රැන්සිස් සේවියර් පෙර පාසලේ වාර්ෂික සිංහල අලුත් අවුරුදු උත්සවය හල්පේ මීසම් සේවක පියතුමන්ගේ මූලිකත්වයෙන් හා දූ දරුවන්, දෙමාපියන්ගේ සහයෝගයෙන් ඉතා උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. මේ එහි සේයා රූ කිහිපයකි.

සේයා හා සටහන :
එච්. ඒ. කල්දේරා







